# බල අපරාධ පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක්
## (ශ්‍රී ලංකාවේ දණ්ඩනීති සංග්‍රහයේ සංගෘහිත අපරාධ සහ බුද්ධකාලීන භාරතයේ පැවති අපරාධ ඇසුරෙන්)

එස්. බී. එම්. එන්. ඩබ්ලිව්. ජයසූරිය[1], එම්. ඩී. ජයසේන[2]

පුද්ගල සමූහයකින් යුක්ත වූ විධිමත් සහ අවිධිමත් සමාජ කණ්ඩායමක් සමාජයක් ලෙස හඳුන්වයි.අවිධිමත් සමාජ ක්‍රමිකව සංවර්ධනය වීමේදී ඒවා විධිමත් සමාජ බවට පරිවර්තනය වී ඇත. එවැනි විධිමත් සමාජ ආපසස්සට හැරවීමට සමත් යම් කිසි චර්යාවක් වේද ඒවා අපගාමී චර්යා ලෙස හඳුන්වයි. එවැනි අපගාමී චර්යා පුද්ගලයාටත් පොදුවේ සමාජයටත් ඉතා අහිතකර වේ.එවැනි අපගාමී චර්යා ක්‍රමිකව වර්ධනය වි සමාජ ගැටලු බවට පරිවර්තනය විමත් සමගම සමාජ ධර්මතා බිඳවැටි සමාජය අනෝමියත්වයට පත්වේ.

මුල් කාලයේදී යක්ෂ, ප්‍රේත, භූත ආදි අදෘෂ්‍යමාන බලවේගයන්ගේ බලපෑම මත අපගාමී චර්යා බිහිවූ බැව් විශ්වාස කළද සමාජ සංවර්ධනය විමත් සමගම ඒවා අදෘෂ්‍යමාන බලපෑම් මත නොව පුද්ගලයින්ගේ අපගාමී චර්යාවල ප්‍රතිඵලයක් ලෙස හඳුනා ගැණුනි. ඒ ආශ්‍රයෙන් අපගාමී චර්යා නීතිය හමුවේ අපරාධ ලෙස නම්නිකරණය වී අපරාධ ලෙස හැඳින්වීම, පාලනය, නිවාරණය, නීතිය, දණ්ඩනය ආදී දෑ උදෙසා මේ පසුබිම නිර්මාණය වන්නට විය. ඒ අනුව අපරාධ යනු **"ව්‍යවස්ථාපිතනීතිය උල්ලංඝනය කිරිමක්"** ලෙස ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය දක්වා ඇත.

මේ ආශ්‍රයෙන් අපරාධයක් හඳුනා ගත හැකි ලක්ෂණ 07ක් ජෙරම් බෙන්තම් දක්වා ඇත.

1. ක්‍රියාවක් පැවතිම
2. ක්‍රියාවට නීත්‍යානුකූල භාවයක් පැවතිම
3. පිඩාවක් තිබිම
4. හේතුඵල සම්බන්ධතාවක් තිබිම
5. සාවද්‍ය චේතනාවක් පැවතිම
6. සංගමනය හෙවත් එකට ක්‍රියා කිරිම
7. දඬුවමක් පැවතිම

[1] අපරාධ විද්‍යා හා යුක්ති අධ්‍යයනාංශය, සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකාව
Wimukthijayasooriya212@gmail.com

[2] අපරාධ විද්‍යා හා යුක්ති අධ්‍යයනාංශය, සමාජ විද්‍යා හා මානව විද්‍යා අධ්‍යනාංශය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ගංගොඩවිල, නුගේගොඩ, ශ්‍රී ලංකා
madgusankadananjaya1993@gmail.com

මෙවැනි ලක්ෂණ යම්කිසි අපගාමි චර්යාවක පවතින්නේද එය අපරාධයක් ලෙස හඳුනා ගත හැකිය. නමුදු අපරාධ ඒ ඒ කාලයෙන් කාලයට සමාජයෙන් සමාජයට සේම රටින් රටට නීතියේ අර්ථකථන මත වෙනස්වේ.

ශ්‍රී ලංකාව වනාහි තුන්වන ලෝකයේ දියුණු වෙමින් පවතින රටකි. පීතෘ මූලික සමාජ ක්‍රමයක් සහ ස්වයංපෝෂිත අර්ථ ක්‍රමයක් පැවති ශ්‍රී ලංකාවේ අතීතයේ දේපළවලට එරෙහි අපරාධ සේම පුද්ගලයාට එරෙහි අපරාධ බහුල ලෙස පැවතියද ඒවා නාගරීකරණය, ගෝලීයකරණය, විශ්ව ගම්මාන සංකල්පය සේම නවතාක්ෂණයේ දියුණුවත් සමගින් සංවර්ධනය වී ඇත්තා සේම ඉන් සමාජයට ප්‍රබල බලපෑමක් එල්ල කරමින් ඇත. අපරාධ වල විස්තර විභාග කෙරේ දක්වන නීතිය,සාක්ෂි පිළිබඳ නීතිය හා අපරාධ නඩු විධානය සේම දණ්ඩන නීතිය ඒ ඒ කාලානුරූපීව ශ්‍රී ලංකාවේ සංශෝධනය හා සම්පාදනය වීම තුළින් ම අපරාධයන්හි ප්‍රබලත්වය තහවුරුවේ. සමාජයට බලපෑම් කරන එවැනි බරපතල අපරාධ එනම් බල අපරාධ 21ක් දණ්ඩ නීති සංග්‍රහයේ දක්වා ඇත. සාවද්‍ය මනුෂ්‍ය ඝාතනය, බරපතල තුවාල කිරිම, සාපරාධී විශ්වාසය කඩකිරිම, ගෙවල් බිඳීම, වංචාකිරිම, තුවාල කිරිම, ස්ත්‍රී දූෂණය ප්‍රමුඛය.

ක්‍රි.පූ 06 වන සියවසේ භාරතයේ බුදු දහම ප්‍රචලිත වන අතර එහි ආභාසය ශ්‍රී ලංකාවට ක්‍රිස්තු පූර්ව තුන් වන සියවසේ දී මිහිඳු හිමිගේ වැඩමවීමෙන් උරුම වේ. ශ්‍රී ලංකාව අදටත් බෞද්ධාගමික රටක් වශයෙන් හැඳින්වීම තුළින්ම එය මනා කොට ප්‍රත්‍යක්ෂ වේ. විශ්ව ව්‍යාප්ත බුදු දහම මානුෂීයවාදයකි. **"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි"** යන්නෙන් බුදුදහම තුළ චේතනාව සියලුම කර්මයන්ට හේතුවන බව සඳහන් වේ. අයහපත් චේතනාව අයහපත් කර්මයන්ට උපස්ථම්භක වන අතර පුද්ගලයාට, සමාජයට යම්කිසි අකටයුත්තක් සිදුවන, සිදු කරන යම්කිසි කාර්යක් වේද එය බුදු දහමින් ප්‍රතික්ෂේප කරයි. එවැනිචර්යා, අපගාමී චර්යා ලෙස හඳුනා ගත හැකි අතර වර්තමාන නිර්වචන මත පදනම්ව එවායේ සමහරක් අපරාධ ගණයෙහිලා ද හඳුනා ගතහැකිය. බෞද්ධ දර්ශනය අනුව බෞද්ධ විනය, බෞද්ධ නීතිය, බෞද්ධ දණ්ඩන සම්ප්‍රදාය පැවතුනි. ඒ ආශ්‍රයෙන් එවැනි අපගාමි චර්යාවන් අවම කරනු වස්ද නිවාරණය කරනු වස්ද කටයුතු යොදා ඇත. බෞද්ධ නීතිය ප්‍රධාන පදනම් 02කින් යුක්ත වේ. පළමුවැන්න මධ්‍යම ප්‍රතිපදාව හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයයි. දෙවැන්න සමාජ විද්‍යාත්මක අවශ්‍යතාවයි. ඒ අනුව නීතියේ චර්යාත්මක වැදගත්කම මධ්‍යම ප්‍රතිපදාවෙන් ආමන්ත්‍රණය වන අතර නීතිමය සහ සමාජ වැදගත්කම සමාජ විද්‍යාත්මක අවශ්‍යතාව මත බැඳි පවතියි. අපරාධ වර්ගිකරණය කිරිමෙහිලා ඉතාමත් බරපතල අපරාධ පාරාජිකා ලෙසින් හඳුන්වනු ලැබිය. ඒ මත එවැනි බරපතල අපරාධවල නිරත වන්නන් හට ලබා දෙන දඬුවම් කිහිපයකි.

1. පාරාජිකා (ඉතා බරපතල දඬුවම්)
2. පරිවාසය (පරිවාස නීති රීති)
3. නිස්සග්ග (පාචිත්‍ය නීති රීති)

ලෙස හඳුනා ගත හැකිය. එවැනි දඬුවම් පැණවීම, නීති සම්පාදනය විමට තරම් එකල්හිද අපගාමි චර්යා ඉතා ප්‍රබල මට්ටමින් සමාජයට බලපෑම් කර ඇති බව පැහැදිලිය.

වර්තමානයේ අපරාධ ගණයෙහිලා නිර්වචනය කරන්නාවූ අපරාධ සමකාලින බුද්ධ කාලයේ දි ද අපරාධ ලෙස නිර්වචනය නොවුවද අපගාමී චර්යා ලෙස බලපැවත්වුණු බව ප්‍රක්ත්‍යක්ෂය. එදා දේපළ වලට එරෙහි අපරාධ, පුද්ගලයාට එරෙහි අපරාධ සරල මට්ටමින්පැවතුනද අද ඒවා තාක්ෂණය මත පදනම්ව සුදු කරපටි අපරාධ, තාක්ෂණික අපරාධ, සංවිධානාත්මක අපරාධ, අන්තර් ජාතික ත්‍රස්ත්‍රවාදය ලෙසින් වර්ධනය වී ඇත.

දණ්ඩ නිති සංග්‍රහය මත පදනම්ව "බල අපරාධ" (21) ලෙස විග්‍රහ කරන අපරාධ, බොහොමයක් බුද්ධකාලින සමාජය තුළ අපරාධ නොවතත් අපගාමී චර්යා ගණයෙහිලා හඳුනා ගත හැකිය. ඒ අනුව එම අපගාමී චර්යා අපරාධ විද්‍යාත්මක ලක්ෂණ මත පදනම්ව බුද්ධ කාලය තුළ පැවති බව දණ්ඩ නිති සංග්‍රහයේ බල අපරාධ පදනමින් විග්‍රහ කිරිම මෙම පර්යේෂණයෙන් සිදු කොට ඇත.

සමකාලීන බුදුසමය තුළ පැවති අපරාධ හඳුනා ගැනිම හා ඒවා වර්තමානයේ දි කෙසේ සංවර්ධනය වි ඇද්දැයි හඳුනා ගැනිමත් ඒ ආශ්‍රයෙන් බරපතල අපරාධ බුදු දහමින් විස්තර විම හා අපරාධ පාලනයට හා නිවාරණයට බුදු දහමින් ලැබෙන පිටිවහල හඳුනාගෙන පෞද්ගලිකව අපගාමී චර්යා ස්වයංපාලනය කර ගැනීමත් පොදුවේ ඒවා වැලක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහිත් අවධාණය යොමු කිරිම වැදගත් කොට සැලකිය හැකිය.

නූතන බල අපරාධ විෂයෙහි සමකාලින බුදු දහමේ අපගාමි චර්යා අතර යම් සම්බන්ධතාවක් පවතිද යන්න පර්යේෂණයට භාජනය විය. නූතන බල අපරාධ විමර්ෂණයට දණ්ඩ නීති සංග්‍රහය ප්‍රමුඛව භාවිතා කරන ලද අතර ඊට අමතරව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සාක්ෂි ආඥා පනත, අපරාධ නඩු විධාන සංග්‍රහය භාවිතයට ගන්නා ලදි. සමකාලින බුදු සමය තුළ අපගාමි චර්යා හඳුනා ගැනිමට එසමයෙහි සිදුවූ අවස්ථා, සිද්ධි සහ කතා පුවත් එනම් රජ්ජුමාලා කතා පුවත, අංගුලිමාල, සුනීත සෝපාක, අජාසත්ත ක්‍රියාකලාපය, සිරිමා, ඛේමා, උප්පලවණ්ණා, කුණ්ඩලකේෂි,නාලාගිරි දමනය ආදි කතා පුවත් අදාළ ප්‍රස්තුතය තහවුරු කරනු වස් භාවිතා කොට ඇත. බෞද්ධ දර්ශනයේ පදනම්ව අපගාමී චර්යා විවරණය හා නිවාරණය කිරිමට සූත්‍ර භාවිතය; කාලාම සූත්‍රය, වසල සූත්‍රය, පරාභව සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය ආදි සූත්‍ර ආශ්‍රයෙන් විග්‍රහ කොට ඇත.

ප්‍රධාන අරමුණ වශයෙන් නූතන බල අපරාධ සහ සමකාලීන බුද්ධ කාලයේ අපරාධ අතර යම් සම්බන්ධතාවක් තිබේදැයි විමර්ෂණය විය. පැවතියාවූ එවැනි අපරාධ නූතන සමාජ සන්දර්භය කෙරෙහි විකාශනය විමේ ආකාරයත් එවා වර්තමාන සමාජයේ බල පැවැත්තෙන ආකාරයත් හඳුනා ගත හැකිය. එසේම අපරාධ පාලනය සහ නිවාරණයෙහිලා බෞද්ධ දර්ශනය තුළින් ලැබෙන පිටිවහල

අධ්‍යයනය කිරීම සේම වර්තමාන සමාජයට ඒවා අදාළ කර ගැනීමේ ක්‍රමවේදය කෙරේ අවධාණය යොමු කිරීමත් මෙහි උප අරමුණු ලෙස දැක්විය හැකිය.

මෙම පර්යේෂණයෙන් තහවුරු වූයේ සමකාලීන බුද්ධ කාලයේ අපගාමී චර්යා සහ නූතන බල අපරාධ අතර සම්බන්ධතාවයක් පවතින බවයි. එදා සරල ලෙස අපගාමී චර්යා පැවතුනද ඒවා අද නූතන තාක්ෂණයේ දියුණුව සහ අන්තර්ජාතික සබඳතා මත ක්‍රමිකව විපර්යාසයන්ට භාජනය වී සංවර්ධනය වී ඇතිවාක් මෙන්ම එදා පැවති සරල අපරාධ බල අපරාධ ගණයෙහිලා ප්‍රබලවත්වය සහ බලපෑම මත වර්ධනය වී ඇත. තවද එම අපචාරී ක්‍රියා මෙකල අපරාධ ලක්ෂණ මත අපරාධ ගනයෙහිලා විග්‍රහ කිරීමේ සාධක හඳුනා ගැනුණි. බෞද්ධ දර්ශනය තුළින් එවැනි අපරාධ, අපගාමී චර්යා පාලනය සහ නිවාරණය වස් පුද්ගල හැඩ ගැස්වීම්, පාරිසරික හැඩ ගැස්වීම් ආකල්ප සහ චර්යාමය හැඩ ගැස්වීම් ආදිය ප්‍රධාන කොට පංචශීල ප්‍රතිපත්තිය, දස රාජ ධර්ම, සතර අගතිගාමීන්, සප්ත අපරිහානි ධර්ම මගින් සිදු කොට ඇත.

ඒ ආශ්‍රයෙන් නූතන බල අපරාධ වනාහි අපගාමී චර්යාවල වර්ධනයක් ලෙසට හඳුනා ගත හැකිය. සමකාලීන බුද්ධ කාලය තුළදී එවැනි අපරාධ දාර්ශනික පදනමක් මත ආමන්ත්‍රණය වී නිවාරණය වුවද නූතනයේ ආගම පරයා යමින් නීතිය යටතේ දැඩි නිවාරණයකට වැළක්වීමකට සහ දණ්ඩවයකට රාජ්‍ය මට්ටමේන් කටයුතු යොදා ඇති බැව් ප්‍රත්‍යක්ෂ වේ.

ප්‍රමුඛ පද : අපගාමී චර්යා, බල අපරාධ, අනෝමීයත්වය, සමකාලීන බුද්ධ කාලය,

ආශ්‍රිත ග්‍රන්ථ

දණ්ඩනීති සංග්‍රහය. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමෙන්තුව. 2015 සංශෝධිත මුද්‍රණය

අපරාධ නඩුවිධාන සංග්‍රහය. ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමෙන්තුව. 2015 සංශෝධිත මුද්‍රණය.

1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නීතිඥ හෙට්ටිගේ, නිලන්ත. (2009). අපරාධ නීතිය. වාසනා ප්‍රින්ටර්ස්.

රත්නපාල, නන්දසේන. (2006). අපරාධය හා දඬුවම. ගනේමුල්ල: ජයන් ප්‍රින්ට් ග්‍රැෆික්ස්.

රත්නපාල,නන්දසේන. බුදුදහම සමාජ විද්‍යාව හා ජන ජීවිතය. වරකාපොළ: ආරිය ප්‍රකාශකයෝ.